බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය
Tel: +94 025 2222367
**E-mail: mahaviharasl@gmail.com**
**Web: http://www.srimahabodhi.lk**

# 2017
# ඉල් පොහෝදින
# ධර්ම දේශනා 1



බෝමළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය

# 2017

## ඓතිහාසික අනුරාධපුර මහා විහාරයේ
## ඉල් පුන් පොහෝ දින සන්නිපාත ශාලාවේපැවැත් වූ

## ධම්මපද පාලියේ පුප්ඵ වග්ගය ඇසුරින්
## ජීවිතය නැමැති මල් මාලය ගොතන්නේ කෙසේද
## ධර්ම දේශනය


**දේශකයාණෝ**

**පූජ්‍ය මල්වානේ චන්ද්‍රරතන හිමි**
**අංශාධිපති, කැලණිය විශ්ව විද්‍යාලය, සිංහල අධ්‍යයන අංශය**

බෝ මළුව පන්සල
මහා විහාරය
අනුරාධපුරය.


03-11-2017


Tel: +94 025 2222367
E-mail: mahaviharasl@gmail.com
Web: http://www.srimahabodhi.lk

## පුණ්‍යානුමෝදනාව

පූජ්‍ය පල්ලේගම සිරිනිවාස නායක ස්වාමීන් වහන්සේ
අටමස්ථානාධිපති

# ධම්මපද පාලියේ පුප්ප වග්ගය ඇසුරින් ජීවිතය නැමැති මල් මාලය ගොතන්නේ කෙසේද ධර්ම දේශනය

**<u>නමස්කාරය...</u>**

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

නමෝ තස්ස භගවතෝ - අරහතෝ සම්මා සම්බුද්ධස්ස

**<u>දේවආරාධනය....</u>**

සමන්තා චක්ක වාලේසු

අත්‍රා ගච්චන්තු දේවතා

සද්ධම්මං මුනිරාජස්ස

සුනන්තු සග්ග මොක්ඛදං

**<u>කාල ඝෝෂණය...</u>**

ධම්මස්සවන කාලො - අයං භදන්තා

ධම්මස්සවන කාලො - අයං භදන්තා

ධම්මස්සවන කාලො - අයං භදන්තා

"යථාපි පුප්ඵරාසිම්හා, කයිරා මාලාගුණේ බහූ;

ඒවං ජාතේන මච්චේන, කත්තබ්බං කුසලං බහුං"

ශ්‍රද්ධාවන්ත සත්පුරුෂ ගුණගරුක පින්වත්නි, ශාන්තිනායක තිලෝගුරු අමාමෑණී ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් මේ ලෝක සත්ත්වයා වෙත ඇති උනා වූ මහා කරුණාවෙන් යුක්තව දේශනා කරන්නට යෙදුන ඉතාමත් වැදගත් ගාථා ධර්මයක් මගේ මාතෘකාව වශයෙන් තබාගත්තා. මම සූදානම් වන්නේ මේ පින්වත් පිරිසට අප ලොව්තුරා බුදුරජාණන් වහන්සේ විසින් උගන්වා වදාළ, බණ පදයක තේරුමඅවබෝධ කරල දෙන්න.

මේ පින්වත් පිරිස, ඇසළ පෝය දවසේ ඓතිහාසික අනුරාධපුර ජය ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියස මේ ධර්ම ශාලාව තුලත් මේ මළුවේ සෑම තැනකමත්, අද මේ අෂ්ඨාංග ශීලය සමාදන්වෙලා ශීලවන්තපිරිසක් බවට පත් වී දැන් මේ සූදානම් වන්නේ ධර්මශ්‍රවණය කිරීමටයි.

අනුරාධපුර අටමස්ථානාධිපති උතුරු මධ්‍යම දෙපළාතේම ප්‍රධාන සංඝනායක, ඒ වගේමයි සද්ධර්ම ජෝතික ධජආචාර්ය පූජ්‍ය සිරි සුමන ධර්මක්ඛිත සිරිනිවාසාභිධාන අපගේ නායක ස්වාමීන් වහන්සේගේ අවවාද අනුශාසනා ලබමින්, ඉතා වැදගත් පින්කම් මාලාවක් මේ සිද්ද කරන්නේ, උන්වහන්සේගේ අවවාද අනුශාසනා ඇතිව මේ කටයුතු සිදු කරනු ලබන ගෞරව ශාස්ත්‍රවේදී අපේ කිරින්දේඥාණදර්ශන ස්වාමීන්ද්‍රයන් වහන්සේගේ මඟ පෙන්වීමෙන් බොහොම වැදගත් පින්කම් මේ සිදුකරන්නෙ.

මේ වගේ පින්කම් දකින හැම වෙලාවෙම අපිට අපේ රටේ ඉතිහාසය නැවත සිහිය එනවා. අපි පටන් ගත්ත බිමේ සිට තමයි, අප මේ ධර්ම දේශනාව පවත්වන්නේ, අනුරාධපුර යුගයෙන් පටන් ගත්ත අපි පොළොන්නරුව, දඹදෙණිය, කුරුණෑගල, ගම්පොල, කෝට්ටේ, සීතාවක, මහනුවර පහුකරගෙන අද අපි කොළඹට පැමිණ තිබෙනවා.

අපි මේ පසුකරපු ඉතිහාස ගමන් මග අනුරාධපුර යුගයේ සිට කොළඹ දක්වා ආ ගමන, ලෝක ඉතිහාස කතා පොතේ වෙනම පරිච්ඡේදයක සටහනක් තබලා තිබෙනවා. ඒ තමයි පින්වතුනි අපි මුදල, ධනය පසෙක තබා ගුණයත් දහමත් හිස මත තබා ගත්ත ලෝකයේ එකම ජාතිය ජීවත් වෙන්නේ මේ පුංචි රටේ. ඒ නිසා පින්වතුනි, අනුරාධපුර යුගයේ පෙරදිග විතරක් නෙමෙයි අපරදිග මිනිස්සුත් අපිට 'ධර්මද්වීපය' කියන මේ උත්තරීතර පූජනීය වචනය දීලා, අපිට සත්කාර සම්මාන ගෞරව දක්වන්න පටන් ගත්තා.

ලෝක ඉතිහාසය අප තරම් ගෞරවලබපු අප තරම් ලෝකයාගේ සම්මානනයට පාත්‍ර වු වෙන මොනම ජාතියක්වත් ලෝක ඉතිහාසයේ හිටියේ නෑ. ඒ වෙන මොනම දෙයක් නිසාවත් නොව අපේ රට ලෝක සිතියම ගත්තහම ඇහැට පේන්නෙ නැති තරම් පුංචි තිතක්. මේ පුංචි රටට බණ දන්න මිනිස්සු ජීවත් වෙන රට කියන අර්ථයෙන්, 'ධර්මද්වීපය'කියන පූජනීය වචනය දුන්නේ.

එදා බුදුරජාණන් වහන්සේගේ අසිරිමත් දහම් පණිවිඩය අනුබුදු මිහිඳු මහරහතන් වහන්සේ විසින් ලංකාවට හඳුන්වා දීමෙන් පස්සේ, ඒ ශ්‍රී ලංකා ඉතිහාසයේ

සංධිස්ථානය, හැරවුම් ලක්ෂය. එදා සිට අප මුදල, ධනය පසෙක තබා ගුණයත් දහමත් හිස මත තබාගෙන ඒ ගුණයට දහමට අනුගත වෙමින් ඒ ගුණයත් දහමත් රකිමින්, ඒ ගුණයත් දහමත් පෝෂණය කරමින්, ලෝක ඉතිහාසයේ අප අභිමානවත් ගමනක පැමිණ තිබෙනවා. ඒ නිසා පින්වතුනි ඒ උරුමය පටන් ගත්ත ඓතිහාසික බිම අනුරාධපුරය, ඒ භූමියේ සිට තමයි අපි මේ ධර්ම දේශනාව පවත්වන්නේ.

ඒ නිසා මේ පින්වත් පිරිස් අද මේ පුර පසළොස්වක පොහෝ දිනයේ, ඓතිහාසික පූජා නගරයට පැමිණිලා, ඔය ඉතිහාස කතාව හොඳට මතක තියාගන්න.ඒ නිසා මේ උදවියට බණ අමුතුවෙන් අවශ්‍ය වෙනවා කියලා මං කල්පනා කරන්නේ නෑ.මේ පුංචි දරුවගේ පටන් තරුණ මහළු උපාසකවරු කව්රුත් අද මේ සිල් සමාදන්ව වෙහෙරට පැමිණියේ අමාරුම කරන දහම් පණිවිඩය ශ්‍රාවකයාට මැනවින් අවබෝධ කරගන්න හොඳට දැනගෙන, දහමට අසීමිතව හිතවත්ව දහමට ළෙන්ගතුව දහම් සිතේ තබාගෙන ජීවත් වන නිසා.

පින්වතුනි, බණ  දන්නේ නැත්නම්, දහමට හිතවත් බවක් සිතේ නැත්නම්,  දහමට ලෙන්ගතු නැත්නම්  දහමට හිතවත් බවක් දයාබර බවක් සිතේ නැත්නම්, කවදාවත් ධර්ම ශ්‍රවණයට වාඩිවෙන්න සිත ඉඩදෙන්නේ නැහැ.ඔබ දහමට අසීමිතව ආදරය කරන නිසයි අද මේ ධර්ම ශ්‍රවණයට වාඩිවී සිටින්නේ, ඔබ සසර පින් වලට ආදරය කළ උදවිය, ඒකයි මම කිව්වේ අමුතුවෙන් ඔබට බණ ඕන නැහැ කියලා. බණ දැනගෙනයි මේ ධර්මය ශ්‍රවණය කරන්නේ.

අප ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සෑම තැනකම වගේ මානව ජීවිතය පිළිබඳවත් එහි ප්‍රශ්න පිළිබඳවත් හරියට සාකච්ඡා කරලා තිබෙනවා.මේ ජීවිතය ගැන බණ දේශනා කරන්නට යන බුදුහාමුදුරුවෝ ස්වභාව ධර්මයේ යම් යම් වෙනස්කම් උපමා වශයෙන් යොදා ගත්තා තමා දේශනා කරන්නට යන දහම් පද ශ්‍රාවකයාට මැනවින් අවබෝධ කරවන්නට.

නැගෙනහිරින් හිරු පායනවා, හවසට බටහිරින් හිරු බැහැගෙන යනවා.උදෑසන ලස්සන මල් පිපෙනවා හවස් වෙනකොට මේ මල් පරවෙලා පෙති බිමට වැටෙනවා.මිනිස්සු ඉපදෙනවා, ජීවත්වෙනවා, මැරෙනවා මුළුමහත් භෞතික ලෝකයම එකම න්‍යායකට අනුගතව ක්‍රියාත්මක වෙන්නේ.

එක දවසක් අපේ බුදු හාමුදුරුවෝ මනුස්සයෙක්ව හම්බවෙන්න ගියා, ඒ මනුස්සයා රැකියාවක් කරන කෙනෙක් මොකක්ද මේ රැකියාව? මල් වලින් මල් මාලා හදලා මල් මාලා විකුණමින් ජීවත් වෙන කෙනෙක්.අද අපිට දකින්න ලැබෙනවා මල් විකුණමින් ජීවත් වෙන්න ඕනෑ තරම් උදවිය. මේ මනුස්සය හම්බවෙන්න ගිය බුදු හාමුදුරුවෝ, මේ මනුස්සයාට ලස්සන උපමාවක් දේශනා කරනවා එක්තරා දවසක එක්තරා මනුස්සයෙක් කැලෑවේ ගිහිල්ලා කැලෑවේ නොයෙක් වර්ගයේ ගස්වලට නැගල ඒ ගස්වල අතු අග පිපී තිබෙන වර්ණවත් සුවඳවත් මල් කඩාගෙන විශාල මල් කූඩයක් හදාගෙන දවසක් ඔබව හමුවෙන්නට පැමිනෙනවා.

මේ විශාල මල් කූඩය මේ මනුස්සයා ඔබ ඉදිරියට පැමිණ බිමට හලනවා, මේ මල් ගොඩේ තිබෙනවා ලස්සන මල්, පාට පාට මල්, සුවඳවත් මල්, විවිද හැඩ ගත්ත මල්, ඒ වගේම මේ කූඩයෙ තිබෙනවා පොඩිවෙච්ච, පරවෙච්ච, කුණුවෙච්ච මල්. බැලූ බැල්මට ඔබට ඒ තරම් ප්‍රීතියක් සතුටක් දැනෙන්නෙ නෑ ඔබ කරන්නේ මේ මල් ගොඩ, මල් මාලා හදන්න දක්ෂ මල් කරුවකුට භාර දෙනවා මේ මල් අරගෙන අපිට ලස්සන මල් මාලයක් ගොතලා දෙන්න කියලා. මේ මල්කරුවා කරන්නේ පළමුව, මේ මල් තෝරන්න පටන් ගන්නවා. ඔහුගේ අතට හසු වන ඉරුන, තැලුන, පොඩි වුන මල් කිසිම සමාවක් නෑ පැත්තකට විසි කරලා දානවා.

ඉතුරු ගොඩම නැවත වාරයක් වර්ග කරනවා වර්ණවත් මල් වෙනම, සුවඳවත් මල් වෙනම, ලොකු මල් වෙනම, පොඩි මල් වෙනම ලෙස වර්ග කරගන,රැහැනක් අරගෙන ලණුවක් අරගෙන් එක එක මල අමුණන්න පටන් ගන්නවා, දැඩි ඉවසීමෙන් හා විමසීමෙන් යුක්තව. ආවට ගියාට මොනම මලක්වත් මේ මල්කරුවා මේ මල් ගොඩේ තියන්නේ නෑ.මොකද මේ මල්කරුවා මල් මාලා හදලා ලොකු පුහුණුවක් තිබෙන පරිචයක් තිබෙන මල් කරුවෙක්,තියන්න ඕන තැන මලෙන් මල තබමින් ලස්සන මල් මාලයක් ගොතාලා, ඒ මල් මාලය දැන් ඔබට පලන්දනවා.

පින්වතුනී, ඉස්සල්ලා මල් ගොඩ දිහා බලලා ඔබට දැනෙන සතුටට වඩා ලොකු සතුටක් ප්‍රීතියක් ඔබට දැනෙන්න පටන් ගන්නවා මේ මල් මාලාව දැක්කාම ඇයි? මේ මල් මාලාවේ ඉරිච්ච මල් එකක්වත් නෑ. තැලිච්ච පොඩිවෙච්ච කුණුවෙච්ච පර වෙච්ච එකම

මලක්වත් මේ මල් මාලාවේ නෑ. මේ මල් මාලාවේ තියෙන්නේ ලස්සන මල්, පාට පාට මල්, සුවඳ හමන මල් ඒවාත් තියෙන්නේ පිළිවෙලකට.

අපේ බුදුහාමුදුරුවෝ, මන් ඔබට මුලින් සඳහන් කළ,

"යථාපි පුප්ඵරාසිම්හා, කයිරා මාලාගුණේ බහූ;

ඒවං ජාතේන මච්චේන, කත්තබ්බං කුසලං බහුං"

මේ ගාථාව මුල් කරගෙන අපට උගන්වනවා ඔබත් මමත් ජීවත්වන මේ ලෝකය විශාල මල් ගොඩක් අපි මේ මල් ගොඩෙන් මල් අරගන මල් මාලයක් ගොතාගන යන එක තමයි මේ සිද්ද කරගෙන යන්නේ. අපේ ජීවිතය කියන්නේ, ජීවන චාරිකාව කියන්නේ, ජීවන වන්දනාව කියන්නේ ලෝකය කියන මල් ගොඩෙන් මල් අරගෙන ජීවිතය කියලා මල් මාලාවක් නිර්මාණය කරගන්න එක. දැන් මේ පින්වතුන්ට ප්‍රශ්න ගණනාවක් මතු වෙන්න ඇති ඇත්තටම මේ ලෝකය මල් ගොඩක් ද?

ඇත්තටම මේ ලෝකය මල් ගොඩක් නම්, මේ ලෝකය නැමති මල් ගොඩෙන් මල් අරගන,අපි ජීවිතය නමැති මල් මාලයක් නිර්මාණය කරගෙන තිබෙනවා නම් දැන් මේ වන විට ජීවිත මාලාවේ ස්වභාවය කොහොමද? ප්‍රශ්න ගණනාවක් ඇති වෙන්න ඇති. පින්වතුනි, මේ මිනිසා ජීවත් වෙනවා කියන්නෙ, ඇස කන නාසය දිව ශරීරය යන පංච ඉන්ද්‍රියන්ගෙන් රූප ශබ්ද ගන්ධ රස ස්පර්ශ කියන අරමුණු ගන්න එක. වෙන මොනම දෙයක්වත් අපි කරන්නේ නෑ,පංච ඉන්ද්‍රියන්ගෙන් ගන්නා අරමුණු පසුපස මිනිසා දුවගෙන යන ගමනකට මිනිසා ජීවත්වීම කියලා කියනවා.

බොහොම සරලව විග්‍රහ කරල බැලුවොත් මොකක්ද මේ ජීවත් වෙනවා කියන්නේ කියලා අපි කයින් ක්‍රියාකරනවා, කටින් වචන කතා කරනවා, සිතින් සිතනවා කියන මේ ක්‍රියා තුනට.

පින්වත්නි, ඔබ මොනවා හරි වැඩක් කරන්නට පටන් ගත්තට පස්සේ ඔබට හිතෙනවා නම් ඒ වැඩෙන් තවත් කෙනෙකුට කරදරයක්, හිරිහැරයක්, හිංසාවක් පීඩාවක් වෙයි කියලා, මටත් කවදා හරි දවසක කරදර පිණිස පවතී එහෙම හිතෙනවනම්, අන්න එහෙම වැඩ පැත්තකට විසිකරලා දාන්නලූ මොනවගේද? අර මල්කරුවා අවලස්සන මල් පැත්තකට විසිකරලා දැම්මා වාගේ.

මොනවා හරි වැඩක් කරන්නට පටන් ගත්තට පස්සේ ඔබට හිතෙනවා නම් ඒ වැඩෙන් තවත් කෙනෙකුට සෙතක්, ශාන්තියක්, පිහිටක් වෙයි කියලා, මටත් කවදා හරි දවසක පිහිට පිණිස පවතී කියලා හිතෙනවනම්, අන්න එහෙම වැඩ කරන්නලූ මොනවගේද? අර මල්කරුවා අර මල් ගොඩෙන් ලස්සන පාට පාට සුවඳ හමන මල් අරගෙන අර මල් මාලාව ඇමිනුවා වාගේ.හොද වැඩ නැමති ලස්සන, සුවඳවත්, පාට පාට මල් ලෝකය නැමති මල් ගොඩෙන් අරගන මල් මාලාවේ පැළද ගන්න කියලා අපේ බුදුහාමුදුරුවෝ අපට උපදෙස් දීලා තිබෙනවා.වචන පිළිබඳවත් සිතිවිලි පිළිබඳවත් ක්‍රමවේදය එහෙමමයි. නරක සිතුවිලි නරක වචන පැත්තකට විසිකරලා දාන්න ඕනෙ මොනවගේද?

අර මල්කරුවා අවලස්සන මල් පැත්තකට විසිකරලා දැම්මා වාගේ.

හොඳ වචන කතා කරනවා හොඳ සිතුවිලි සිතනවාමොනවගේද අර මල්කරුවා ලස්සන සුවද හමන පාට පාට මල් අරගෙන අර මල් මාලයේ ඇමිනුවා වාගේ. හොඳ වචන නැමතී හොඳ සිතුවිලි නැමතිලස්සන සුවදවත් මල් ලෝකය නැමති මල් ගොඩෙන් අරගන ජීවිතය නමැති මල් මාලයේ අමුනගන්න ඕනේ.ලෝකය කියන්නේ මල් ගොඩක්.ලෝකය නැමති මල් ගොඩේ මල් වර්ග 6ක් තියෙනවා. නරක වැඩ නැමැති කුණු වෙච්ච පරවෙච්ච මල්, හොඳ වැඩ නැමැති සුවඳ හමන ලස්සන පාට පාට මල්,නරක වචන නැමැති කුණු වෙච්ච පරවෙච්ච මල්, හොඳ වචන නැමැති සුවඳ හමන ලස්සන පාට පාට මල්,නරක සිතිවිලි නැමැති කුණු වෙච්ච පරවෙච්ච මල්, හොඳ සිතිවිලි නැමැති සුවඳ හමන ලස්සන පාට පාට මල්.ඔන්න මල් ගොඩ මල් වර්ග 6යි.අපි මේ ජීවන චාරිකාවේ, ජීවන වන්දනාව, සංසාර ගමනේ ජීවත් වෙනවා කියන්නේ මොකක්ද?ඔන්න ඔය මල් තෝරන එක, සමහර මිනිස්සු අතට හසුවන ඕනෑම මලක් අරගෙන ජීවිත මල් මාලාවේ පැළද ගන්නවා. සමහර මිනිස්සු එහෙම නැහැ හරියටම ඒ බණ අහන උදාර චරිත වගේ තෝර ගන්නේ තමාට ගැළපෙන, තමාට උරුම, තමාට හොද මල පමණයි.

පින්වතුනි, බුදුරජාණන් වහන්සේ අපට උගන්වනවා ජීවිත මල් මාලාව පිළිවෙලකට සකස් කර ගන්න කියලා. එහෙම සකස් කරගන්න අවශ්‍ය ධර්ම කාරණා කිහිපයක් මම ධර්ම දේශනාවේ දී සාකච්ඡා කරනු ලබනවා.මේ ලෝකෙ කියන්නේ හොඳත් නරකත් සංකලනය වූ තැනකට, හොඳත් නරකත් කලවම් වූ තැනකට.නරක

පැත්තකට විසි කරලා හොඳ සොයාගෙන යන ගමනක අප මේ යන්නේ.

ඔය කැලෑවල විල් වල පොකුණුවල සත්ත්වයෙක් ඉන්නවා හංසයා කියලා.හංසයාට පුළුවන් කිරියි වතුරයි කලවම් කරලා දුන්නහම වතුර අයින් කරල කිරි පමණක් බොන්න.සත්ත්ව ලෝකයේ කිරෙන් දිය වෙන් කිරීමේ තාක්ෂණය උරුම වී තිබෙන්නේ හංසයාට පමණයි. කෝට්ටේ යුගයේ සිංහල සාහිත්‍යයෙ සන්දේශයක් ලියනවා හංස සන්දේශය කියලා.කෝට්ටේ සිට කැරගල පද්මාවතී පිරිවෙන්පති වනරතන හිමියන් වෙත පණිවිඩයක්තියෙනවා අරගෙන යන්න. මෙහි ග්‍රන්ථාරම්භයේදීම දූතයාට ආශිර්වාද කරනවා ඔහුගේ ගුණයක් ප්‍රකාශ කරලා,

"තොප තුඩ තුලට කිරි රස දිය හැර වදිය"

ඔබට පුළුවන් කිරියි වතුරයි කලවම් කරලා දුන්නහම වතුර අයින් කරල කිරි පමණක් උරා ගන්න.හංසයාට කිරෙන් දිය වෙන් කිරීමේ තාක්ෂණය ස්වභාවධර්මය උරුම කර දෙන විට, මේ ලෝකේ මිනිස්සු අසිරිමත් තාක්ෂණ ක්‍රමයක් උරුම කර ගෙන මෙලොව එළිය දකින්නේ. මොකද්ද ඒ?හොඳයි නරකයි වෙන්කර ගැනීමේ තාක්ෂණික ක්‍රමය. අප උරුම කරගෙනමයි මෙලොව එළිය දකින්නේ.

පිංවතුනේ ඔබත් මමත් මේ උත්තරීතර මනුෂ්‍යත්වය ලබා ගත්තේ ගිය ආත්මයේ හරියට පින් කරලා.ඔබත් මමත් හරියට පින් කළ උදවිය.නැත්තම් ඔබටවත් මටවත් මේ උත්තරීතර මනුෂ්‍ය ආත්මය ලැබෙන්නේ නෑ.ඒ පිනට ලැබෙන ආත්මයක් ලෙස තමයි මනුෂ්‍ය ආත්මයක් ලැබී

මෙලොව එළිය දකින්නේ.මෙලොව එළිය දකින කොටම ප්‍රඥාව අපිට උරුම වෙනව ඒ මොකටද? හොද සහ නරක වෙන් කොට ගන්න. ඒ නිසා පින්වතුනි හොඳ නරක වෙන් කර ගැනීමේ ඥානය ඔබ සතුව තිබෙනවා.

හොඳ නරක තෝරා ගැනීමේ ඥාණය තියෙනවනම් ලෝකය නැමති මල් ගොඩෙන් අවශ්‍ය නිවැරදිම මල තෝරගන්න පුළුවන්, ජීවිත මල් මාලාව ලෝකය නැමති මල් ගොඩෙන් මල් අරගන පිළිවෙලකට සකස් කරගන්න ඕනේ නම්, බුදුහාමුදුරුවන්ගේ දහමට අනුව ජීවත් වෙන්න ඕන. අර මල්කරුවා මල් මාලා ගොතන විට ක්‍රම දෙකක් අනුගමනය කළා.

එකක් ඉවසීම අනෙක විමසීම. පින්වතුනි ඒ වගේම තවත් එවැදගත් කරුණක් තියෙනවා, අපිට එසේ මල් මාලා ගොතන්නට බැරි ප්‍රධානම හේතුව තමයි, අපට හරියට වරදිනවා අප කරන කරන දේවල් වරදිනවා අපි කියන කියන දේවල් වරදිනවා.වරදින එක අරුමයක් පුදුමයක් නෙමෙයි.

මේ ලෝකය පණ්ඩිතයෝ දෙදෙනෙක් ඉන්න බව බුදුහාමුදුරුවෝ උගන්නනවා.

ද්වේමේ භික්ඛවේ...

පළවෙනි පණ්ඩිතයාගේ ලක්ෂණය තමයි තමා කරන වරද තමන්ම දකිනවා,හදාගන්නවා දෙවැනි පණ්ඩිතයාගේ ලක්ෂණය තමා කරන වරද තමාට පෙනෙන්නේ නෑ, වැඩිහිටියෝ දෙමවුපියෝ ගුරුවරයෝ මිත්‍රයෝ පෙන්වල දෙනවා වරදක් කරන්න එපා කියලා බලතල නිලතල පැත්තක තියලානිහතමානීව වරද පිලිගන්නවා හදා ගන්නවා.

බුදුහුහාමුදුරුවෝ කොහෙදිවත් දේශනා කරන්නේ නෑ පණ්ඩිතයා කියලා කියන්නේ වැරදි සිදු නොවන කෙනා කියලා.ඇයි ඒ? එහෙම මිනිස්සු ලෝකෙ නැති නිසා, ඔබටත් මටත් වරදිනවා.ඒ වරදින එක අරුමයක් පුදුමයක් නෙමෙයි. ඒ වැරැද්ද තමන්ම දැක්කහම හදා ගන්නවනම් ආන් පණ්ඩිතයා.වරද පෙන්වලා දුන්නාම නිහතමානීව භාර අරගෙන හදාගන්නවා නම් බුදුහාමුදුරුවො දේශනා කරනවා පණ්ඩිතයෝ කියලා.

දවසක් පින්වත්නි සැරියුත් මහරහතන් වහන්සේ තමන්ගේ පුංචි හාමුදුරුවොත් එක්ක භාවනා කරන්න කැලයට වැඩම කළා. භාවනා කර කර ඉන්නකොට දිනක් සැරියුත් මහරහතන් වහන්සේ අසනීප වුණා. පුංචිහාමුදුරුවෝ හරිම ආදරෙයි සැරියුත් හාමුදුරුවන්ට. රාත්‍රියේ නොදන්වාම කැලෑවෙන් පිටවුනා බෙහෙත් සොයන්න යන්න. රාත්‍රිය පුරාම කැලෑවේ ඇවිද්දා. එළිය වැටීගෙන එනකොට ගම කට ආවා. පාත්තරේ පැත්තකින් තියලා මූන සෝදගන්න වතුර තියෙන තැන්කට ගියා.ඔය කියන දවසේ පෙරදා රාත්‍රියේ ඔය ළඟ ගමකට හොරු වගයක් පැනලා.ගමේ මිනිස්සුන්ගෙ රිදී රත්තරන් බඩුත් අරන් පැනලා යනවා.හොරු දුවන්නේ පුංචි හාමු හාමුදුරුවෝ මූණ හෝදන තැනින්, ගමේ මිනිස්සු පස්සෙන් පන්නගෙන එනවා.මිනිස්සුන්ට හොරු අහුවෙන්නයි යන්නේ.හොරු මොකද කලේ අර රිදී රත්තරන් බඩු ටික පුංචි හාමුදුරුවන්ගේ පාත්තරයට දාලා දිව්වා.ගමේ මිනිස්සු පස්සෙන් පන්නගෙන ආවා. මෙන්න පාත්තරයක් තියෙනවා පාර අයිනේ, ඒ පාත්තරය තුළ කලින්දා රෑ තම නිවෙස්වලින් සොරා ගන්නට යෙදුණු රිදී රත්තරන් බඩු ටික තියෙනවා.

මෙන්න ඒ අසල පොඩි හාමුදුරුනමක් ඉන්නවා. මේ හිමිදිරි පාන්දර මේ ඝන කැලෑවක් අභියස කොහෙන්ද පොඩි හාමුදුරුනමක්? මේ පොඩි හාමුදුරුවෝ තමයි සොරකම් මෙහෙය වන්නට ඇත්තේ. අල්ලගත්තා, ගිහිල්ලා භාර දුන්නා අජාසත්ත රජතුමාට. රජ්ජුරුවෝ කෙලින්ම තීරණය කළා උල තියල මරන්න. හොරුත් ඉන්නවා බඩුත් හම්බුනා, පුංචි හාමුදුරුවෝ උල තිබ්බා.

සැරියුත් මහරහතන් වහන්සේ උදෑසන අවදිවී බලනවා පොඩි හාමුදුරුවෝ නෑ.කරුණු සොයල බැලුවා මහා කරදරයකට පත් වෙලා. කරන්න දෙයක් නෑ බුදුහාමුදුරුවෝ හම්බවෙන්න ගියා.බුදුහාමුදුරුවන් ළඟ සියල්ලම සැල කළා. ලොව්තුරා බුදුරජාණන් වහන්සේ සහ සැරියුත් මහරහතන් වහන්සේ දෙදෙනා වහන්සේලාම අජාසත්ත මහ රජතුමාගේ මාලිගයට වැඩියා. තවම අපවත් වෙලා නැහැ. උල උඩ වේදනාවෙන් ඉන්නවා. සැරියුත් මහරහතන් වහන්සේට දකින කොටම පුංචි හාමුදුරුවන්ට ඇඬෙන්න පටන් ගත්තා.

දෙනෙත් වලින් ගලාගෙන යන කඳුළු වලින් මුළු ශරීරයම තෙත් වෙන්න පටන් ගත්තා.සැරියුත් මහරහතන් වහන්සේට ඒ දිහා බලාගෙන ඉන්නබැහැ. උන්වහන්සේ බිම බලාගත්තා. බිම බලාගෙන බුදුරජාණන් වහන්සේගෙන් විමසනවා, භාග්‍යවතුන් වහන්ස මේ පොඩි හාමුදුරුවෝ කාටවත් කරදරයක් හිරිහැරයක් කරලා නෑ. බණ භාවනා කරමින් ජීවත් වුණේ මා අසනීපව බෙහෙත් හොයන්න ගිය ගමන මේ.මෙවැනි අහිංසක චරිත අවසන් වන්නේ මෙවැනි ඛේදනීය අමිහිරි බිහිසුණු ඉරණම් වලින්ද? බුදුරජාණන් වහන්සේ පොඩි

හාමුදුරුවන්ගේ ජීවිත කතාවේ පිටු පෙරළමින් අතීතයට ගමන් කළා. එක්තරා ආත්මයක පොඩි හාමුදුරුවෝ වරදක් කරල  තියෙනවා.තමන්ගේ අම්මට බැනලා තියෙනවා මේ අම්මා උල තියල මරන්න වටින්නේ කියලා.එකේ විපාක තමයි මේ ශාසනයේ මහණ වෙලත් බණ භාවනා කරමින් ඉඳලාත් සැරියුත් මහරහතන් වහන්සේ වැනි අග්‍රශ්‍රාවක නමකගේ ගෝල නමක් වෙලාත්,  ජීවිතයේ අමිහිරිම බේදනීයම බිහිසුණුම ක්‍රමයකින් සමුගන්න වෙලා තියෙන්නේ. බුදු හාමුදුරුවෝ මේ සේරම කතා  ප්‍රවෘත්තිය සැරියුත් මහරහතන් වහන්සේට දේශනා කළා.මේ සේරම පුංචි හාමුදුරුවෝ උල උඩ ඉඳන් අහගෙන හිටියා.බුදු හාමුදුරුවෝ දිහා බලාගෙන අත් දෙක දොහොත් මුදුනේ තියලා වැදගෙන, කියන්න පටන් ගත්තා අනේ බුදුහාමුදුරුවනේ  දස මාසයක් කුසේ තියාගෙන මේ ලෝකෙට බිහි කරලා කවලා පොවලා හදලා වඩලා ඉස්කෝලෙ යවලා ඒ විතරක් නෙමෙයි බුදු හාමුදුරුවනේ මේ ලෝකෙ විද්‍යාඥයකුටවත් හොයන්න බැරි මහා වීර ක්‍රියාවක් තමන්ගේ ශරීරයේ නහරවැල් තුළ දුවන මේ රතු පාට ලේ සුදු පාට කිරි බවට පරිවර්තනය කරලා, මට පොවපු මගේ ආදරණීය අම්මාට මම ඔය කියන විදිහට බැනලා තිබෙනවා නම් එක වාරයක් නෙමෙයි  බුදුහාමුදුරුවනේ මම දහස් වාරයක් උල තියලා මරන්න වටිනවා.මොකද වුනේ පින්වතුනි, පුංචි හාමුදුරුවෝ රහත් වුණා ඒත් එක්කම පිරිනිවන් පෑවා, වරද පෙන්වලා දුන්නා ඒක බාරගත්තා රහත් වුණා. බාරගන්න එක රහත් වෙන්න තරම් බරපතළ පින්කමක්, මේ සමාජ විස්තරය ගැඹුරින් විමසා බලන්න කොච්චර පොලිසි තියනවද හමුදාව ඉන්නවද?හිරගෙවල් තියෙනවද?නව නීති සම්පාදනය

කරනවද? මිනිස්සු වැරදි කෙරුවහම බාර ගන්ගන්න කැමති නෑ, බාරගන්න අකමැති වුණාම නීතියේ  මූලික සිද්ධාන්තය සිදුවීමට ආදේශ කොට ඔවුන් වරදකරුවන්ද නැද්ද කියලා නෛතික වශයෙන් විමසා බලන්න වෙනවා. වරද තමන්ම හදා ගන්නවනම් නැත්නම් වරද පෙන්වලා දුන්නා මම නිහතමානීව පිලිඅරගන හදා ගන්නවනම්,මෙච්චර පොලිසි ඕනෙද? මෙච්චර හමුදාව ඕනෙද? මෙච්චර හිරගෙවල් ඕනෙද? බලන්නකෝ පින්වතුනි,  අපේ බුදුහාමුදුරුවෝ කොච්චර දුර කල්පනා කරලා බලලා ද මේ කියන්නේ පණ්ඩිතයෝ දෙන්න ඕනි කියලාඅනිත් පණ්ඩිතකම් ඕනේ ලෝකයේ පැවැත්මට, දැහැමි, තැන්පත්, ප්‍රියංකර ලෝකයක් නිර්මාණය කරන්න අවශ්‍ය පළවෙනි පියවරයි බුදුහාමුදුරුවො අපට උගන්වන්නේ.

ඒ නිසා පින්වත්නි ලෝකය නමැති මල් ගොඩෙන් මල් අරගන ජීවිතය නමැති මල් මාලාවපිළිවලකට සකස් කර ගන්න කල්පනාවක් කෙනෙකුට තිබෙනවා නම් බුදුහාමුදුරුවන්ගේ දහමට අනුව ජීවත් වෙන්නට ඕනෙ. මම මුලින් සඳහන් කළා වගේ අර මල්කරුවා මල් මාලා ගොතන කොට අනුගමනයනය කරපු ගුණ ධර්ම දෙකක් තිබුණා.එකක් ඉවසීම අනික් විමසීම. පින්වතුනි ඊයෙට වඩා අද, අදට වඩා හෙට විමසීමත් ඉවසීමත් අපිට තදින් අවශ්‍යයි ජීවත් වෙන්න.ඉවසීම කුමකටද? අප වටා නිර්මාණය වෙන සෑම ප්‍රශ්නයකටම  එකවර උත්තර හොයන්න බෑ. බොහෝ ප්‍රශ්නවලට පිළිතුරු සපයන්නේ කාලය.කාලය නම් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්නේ අපට සිද්ධවෙනවා.

කාලයක් ප්‍රශ්නය සමඟ ජීවත් වෙන්න. එහෙනම් ප්‍රශ්න දරා දරාගන්න ඕන, දැන් මොකක්ද අවශ්‍ය? ඉවසීම ඕනේ.ඔය සමහර උදවිය කියනවා ඉවසීමට සීමා තියනවා කියලා. ඒක නිසරු නිරර්ථක හිස් ප්‍රකාශයක්, ඉවසීමට සීමා මේ ලෝකේ කොහේවත් නෑ. ඉවසීමේ සීමාව කියල කියන්නේ වෛරය ක්‍රෝධය පළිගැනීම. පිනන්වතුනි 2500ක ඉතිහාසයක් උරුම කරගෙන ආපු, අපට ආවේණික, අපට අනන්‍ය, උදාර මානව ගුණධර්ම වලට අවසාන විරාමය තබලා එතැන් පටන් මනසට අප කැන්දගෙන ආවේ වෛරය ක්‍රෝධය, ඒ නිසා පින්වතුනි ඉවසීම තදින් අවශ්‍යයි අපිට.

මං මේ ලඟදී දිනෙක දැක්කා ත්‍රිරෝද රථයක පසුපස තියෙනවා එක්තරා වැකියක්, "ඉවසලා ඉවසලා බැරිම තැන එතනයි ඉවසිය යුතුම තැන කියලා". අපට පින්වතුනි බොහෝ දේවල් මේක ප්‍රකාශය තුළ තියෙනවා.පින්වතුනි මේ සමහර බාල මෝඩ චරිත තිබෙනවා ප්‍රශ්නයක් දෙකක් ජීවිතයට එනකොට ඉවසීමට සීමා තබනවා.මනස කලබල වෙලා, මනස චංචල වෙලා ඉක්මන් තීරණ හා තීන්දු ගන්නවා. ජීවිතය ගිනි ගන්න පටන් ගන්නවා වටා ලෝකයත් සමඟ, මේ බණ අහන උදාර චරිත එහෙම නෙමෙයි ප්‍රශ්න එකින් එක මනසට එන විට, ඉවසීම වැඩි වැඩියෙන් පුරුදු කර කර ගන්නවා. ප්‍රශ්නය මැනවින් නිරීක්ෂණය කරනවා, ප්‍රශ්නයට අදාල නිවැරදිම පිළිතුර සොයා ගන්නවා.එනිසා පින්වතුනි ජීවිත මල් මාලාව පිළිවෙලකට සකස් කර ගන්නට ඕනේ නම්, ඉවසීම තදින්ම ඕනෙ එහෙම නැතුව අපිට ජීවත්වෙන්න අමාරුයි.

අනෙක තමයි විමසීම, මේ විමසීම කුමකට ද?

මේ ලෝකෙ සත්‍යයත් මායාවත් වෙන් කරගන්න. සත්‍යය සහ මායාව වෙන්කරගන්න විමසීම් තදින් ඕනෙ.මායාවට කරන්න පුළුවන් එකම එක දෙයයි, එය සත්‍යයේ වෙස් ගන්නවා. පින්වතුනි ඒ නිසා අපිට විමසීම ඕනේ සත්‍යයත් මායාවත් වෙන්කර ගන්න. දැන් සමහර මිනිසුන් ජීවත් වෙනවා, මේ පින්වතුන් නෙමෙයි මේ පින්වතුන්ගේ සිත් තුළ උදාර ගුණ තියෙන නිසයි මේ ධර්ම ශ්‍රවණයට වාඩිවී සිටින්නේ. සමහර මිනිස්සු ජීවත් වනවා පින්වතුනි හිතේ තියෙන ක්‍රෝධය ඊර්ෂ්‍යාව වෛරය, හැබැයි එළියට එන්නේ සුමුදු පියකරු ප්‍රියංකර සිනහව බවට පරිවර්තනය වෙලා. මගට ඇවිල්ලා වෙස් මාරු වෙනවා ඒවට දහම උගන්වන්නේ වංචනික ධර්ම කියලා. හිතේ තියෙන එකක්, එළියට එන්නේ තව දෙයක්.

පින්වත්නි ඒ නිසා මේ ලෝකය තේරුම් ගන්න අමාරුම සත්වයා මිනිසාඅපි කොහොමදදන්නෙ මේ සිනා වේ තියෙන සුමුදු බව වචන වල තියෙන මිහිරි බව මනසේ ගැඹුරු ම තැන තිබෙනවාද කියලා. හිතේ එකක් කියන්නේ වෙන දෙයක් කරන්නේ තව දෙයක්.ඒ නිසා විමසීම තදින් ඕනේ මිනිසා තේරුම් ගන්න. දැන් මේ ස්වභාව ධර්මයත් පරිසරයත් සත්ව ලෝකයත් තේරුම් ගන්න එච්චර අමාරු නෑ.

මේඝයක් ඈත ආකාසේ එන විට පළමුව සුළඟ අපි කරා එනවා, අපට වැස්සක් ළඟ ළඟ එන බව පවසනවා. අපි ඒ වැස්සට සූදානම් වෙනවා, කොච්චර අවංක ස්වභාවධර්මය අපිත් එක්කවරෙක කෙනෙකුට හිතෙන්න පුළුවන් මහා දැවැන්ත නුග රුකක් ස්වභාව ධර්මය

ලෝකයට දායාද කරලා නුග ඵලය කුඩාවට හදලා අසාධාරණයක් කළා ද කියලා, පිංවතුනි ස්වභාවධර්මය නුග රුකක් ලෝකයට දායාද කරන්නේ මිනිසාටත් සත්ත්වයාටත් සෙවන හදන්න. ඒ ගහේ ගෙඩි ලොකුවට හදලා කොහොමද සෙවන හදන්නේ, ඒ ගහේ ගෙඩි පතිත වීමෙන් සත්ත්වයා අනතුරකට පත් වෙන්න පුළුවන්.නුග රුකක් ස්වභාව ධර්මය ලෝකයට දායාද කරනවා මිනිසාටත් සත්ත්වයාටත් සෙවන හදන්න, නුග ඵලය කුඩාවට හදනවා අනතුරක් වෙයි කියලා මොනතරම් අවංකද සාධාරණද ස්වභාදහම පින්වතුනි මට පරණ කවියක් මතක් වෙනවා.

"සිංහයා කොටියා ගොරවා රවා පනී

එනිසා ඔවුන් රුදු බව ලෝකයා දනී

මිනිසාසිනාසී කරුණා දයාවෙනී

අතගා ඔලුව ඇස් දෙක සූරලා ගනී"

කැලෑව කොටි නයි පොළොංගු සිංහයෝ ඉන්නවා, අපි කවුරුත් ළඟට යනකොට කොටියා ගොරවනවා සිංහයාත් එහෙමයි. ඒ කියන්නේ ලං වෙන්න එපා අපි නපුරුයි කියලා. නයා ළඟට යනකොට පෙනය පුප්පනවා.කොච්චර අවංකද කැලෑවේ සත්ව වර්ග.

පින්වත්නි, හැබැයි මිනිස්සු එහෙම නෙමෙයි එක බත්පත අනුභව කරමින් එකට ජීවත් වෙමින් අපට අනතුරක් කරන තුරු අපි දන්නෑ. ඒ නිසා පින්වත්නි විමසීම තදින් අවශ්‍යයි අපිට ස්වභාව ධර්මය තේරුම් ගන්නට නෙමෙයි, සත්ව ලෝකය තේරුම් ගන්නට නෙමෙයි, පරිසරය තේරුම් ගන්නට නෙමෙයි, මිනිසා තේරුම්

ගන්න විමසීම් තදින් ඕනෙ. ලෝකය නැමැති මල් ගොඩෙන් මල් අරගන ජීවිතය නමැති මල් මාලයක් ලස්සනට ගොතන්න කල්පනාවක් තියෙනවා නම් ඉවසීමත් විමසීමත් තදින් ඕනෙ.එසේ බුදු දහමට අනුව ජීවත් වුනොත් ජීවිත මල් මාලාව පිළිවෙලකට සකස් කර කරගන්නට පුළුවන්.

තවත් පින්වතුනිගැටලු කිහිපයක් තියනවා අපගේ සාමාන්‍ය ජීවිතයේ දී, කොහොමද ජීවිත මල් මාලාව ගොතා ගන්නේ කියලා, වස්සකාර කියලා මහ ඇමති කෙනෙක් හිටියා, මේ වස්සකාර මහ ඇමති දවසක් බුදු හාමුදුරුවෝ හම්බවෙන්න ජේතවනාරාමයට ගියා.ජේතවනාරාමයට ගිය වස්සකාර ඇමති බුදුහාමුදුරුවන්ට දණ ගහලා වැන්දා දනගහලා වැඳලා පැත්තකින් වාඩි වෙලා බුදුහාමුදුරුවන්ට කියනවා.

"බුදුහාමුදුරුවනේ, මම ඔබ වහන්සේව හම්බ වෙන්න හිටියේ මට ඔබ වහන්සේට මගේ ළඟ ප්‍රතිපත්තියක් තියෙනවා කියන්න"

බුදු හාමුදුරුවෝ අහනව වස්සකාර මහ ඇමතිගෙන්

"මොකක්ද ඔබ ළඟ තියෙන ප්‍රතිපත්තිය."

"බුදුහාමුදුරුවනේ මගේ ළඟ ප්‍රතිපත්ති තුනක් තියෙනවා"

"මගේ ඇස් දෙකෙන් යමක් දැක්කොත් මම දැක්ක දේ තවත් කෙනෙකුට කියනවා, කවදාවත් දැක්ක දෙයක් නොදැක්කා කියලවත් නොදැක්ක දෙයක් දැක්කයි කියලා වත් මම බොරුවක් කියන්නෙ නෑ මං සත්‍යවාදී"

"මං යම් දෙයක් කනෙන් ඇහුවොත් අහපු දේ තවත් කෙනෙකුට කියනවා මං කවදාවත් බොරුවක් කියන්නෙ නෑ බුදුහාමුදුරුවනේ."

"තුන්වෙනි එක තමයි මං යම් කිසි දෙයක් කයින් කලොත් කළ දේ ඒ විදියටම කියනවා. මං කරපු දෙයක් නොකළා කියලා වත් නොකළ දෙයක් කළා කියලා වත් බොරුවක් කියන්නේ නෑ."

"මගේ ජීවිතේ එහෙම පිටින්ම සත්‍යවාදී එනිසා මගේ ප්‍රතිපත්ති හොඳයි නේද?" කියලා ඇහුවා බුදුහාමුදුරුවන්ගෙන්.

බුදුහාමුදුරුවෝ එකවර පිරළිතුරු දෙන්න ගියේ නෑ. ටික වෙලාවක් නිහඬව ඉඳලා වස්සකාර මහා ඇමතිට දේශනා කරනවා "වස්සකාර, ඔය වගේ ප්‍රතිපත්තියක් මගේ ලඟත් තියෙනවා හැබැයි පොඩ්ඩක් වෙනස් අහගෙන ඉන්න කියලා,"

"වස්සකාර, මගේ ඇස් දෙකෙන් දෙයක් දැක්කොත් ඒ දේ අනිත් අයට කියන්න යන්නේ ඒ ඇත්තන්ට සෙතක් නම් ශාන්තියක් නම් පිහිටක් නම් යහපතක් නම් කීර්තියක් නම් ලාභයක් නම් පමණයි. මං දැක්ක දෙයක් තවත් කෙනෙකුට කියන්න යන්නේ නෑ. ඒ ඇත්තන්ට අලාභයක් නම් අපකීර්තියක් නම් වේදනාවක් නම් දුකක් නම් අයහපතක් නම් කවම කවදාවත් මම දැක්කත් දැක්කයි කියලා කියන්නේ නෑ. මම ඇහුවත් ඇහුවයි කියලා කියන්නේ නෑ. මම කලත් කලයි කියලා කියන්නේ නෑ."

පින්වතුනි දැන් ඔබ ජීවත්වන සමාජය ඔබ කොච්චර දේවල් දකිනවා ද? ඔබ කොච්චර දේවල් අහනවද? ඔබ

කොච්චර දේවල් කරනවද? මේවා තැන් තැන්වල කියපු දේවල්, දැකපු දේවල්, අහපු දේවල්, තැන් තැන්වල කියන්න ගිහිල්ලා අදටත් ක්‍රෝධයෙන් තරහවෙන් වෛරයෙන් කටයුතු කරපු මිනිස්සු නැද්ද? අදටත් ඔබත් එක්ක නයි වෛරයෙන් ජීවත්වෙන මිනිස්සු නැද්ද?

පින්වතුනි තමන් දැක්ක දේවල්, අහපු දේවල්, කරපු දේවල්,අනිත් අයට කියන්න යන්නේ ඒ ඇත්තන්ට එය සෙතක් නම් ශාන්තියක් නම් යහපත්ක් නම් විතරයි. මේ ක්‍රමය අනුගමනය නොකළොත් අපට අපගේ ජීවිත මල් මාලාව ගොතා ගන්න බෑ.ඒ ජීවිත මල් මාලාවට කුණුවෙච්ච පරවෙච්ච තැලිච්ච පොඩි වෙච්ච මල් එනවා.

ජීවිතය කියලා කියන්නේ පිනංවතුනි එක අතකින් ගත්තහම යාත්‍රාවක් තොටුපලක් කරා ගමන් කිරීමක්, හොඳට මතක තියාගන්න යාත්‍රාවක් නැවක් මහ මුහුදේ යාත්‍රා කරන විට, නැව ගැඹුරු මුහුදට ගියහම ඒ නැව් ගිල්ලන්න පුළුවන් වතුරට හැබැයි නැව ගිල්වන්න පුළුවන් වෙන්නේ වතුර නැව ඇතුළට ආවොත් පමණයි.එතෙක් ගිලෙන්නේ නෑ. දක්ෂ නැවියා වතුර ඇතුළට එන්න නොදී, නැවේ බඳ ආරක්ෂා කරමින් තොටුපළ දක්වා රැගෙන යනවා. හැබැයි නැව ඇතුළට වතුර ආවොත් නැව ගිලෙනවා.

ජීවිතය නෞකාව සංසාර සාගරය මේ ජීවිත නෞකාව සංසාර සාගරේ ගිලෙන්න පුළුවන්, ගිලෙන්න කොහොමද පංචේන්ද්‍රියන්ගෙන් අහක තියෙන කුණු අපේ මනසට ගත්තොත්, මනසට බරයි මිනිස්සු බණින ඒවා මිනිස්සු දොස් කියන ඒවා තැන් තැන්වල කියන දේවල් මනසට ගත්තොත් මනසට විශාල බරක්. මනසට

බර වුනාම මේ ජීවන යාත්‍රාව සංසාර සාගරයේ ගිලෙනවා.

දක්ෂ ජීවිතය පදවන සැදැහැවත් නාවිකයා පංච ඉන්ද්‍රියන්ගෙන් ඇතුළට ගන්නේ තමන්ට අවශ්‍ය හිමි උරුම දේවල් පමණයි.එහෙම මල් වලින් ජීවිතය පුරව ගත්තහම අපට මල් මාලාව පිළිවෙලකට සකස් කරගන්නට පුළුවන්. ඒ නිසා පින්වතුනි ජීවිතයේ සන්ධ්‍යා සමයක් ඔබටත් මටත් එනවා, ඒ සන්ධ්‍යා සමය ආවහාම ජීවිත මල් මාලාව දෙස ආපසු හැරී බලපුහාම පින්වතුනි, සමහරුන්ට දන්නෙම නැතුව ඇඬෙනවා.ඒ මල් මාලාවේ තැලිච්ච පොඩිවෙච්ච කුණු වෙච්ච පරවෙච්ච මල්.

මේ බණ අහන ගොඩක් පිංවතුන්ට, ජීවිත මල් මාලාව දෙස ආපසු ආපසු හැරී බලනකොට අප්‍රමාණ ප්‍රීතියක් දැනෙනවා, ලස්සන පාට පාට සුවඳ හමන මල් තියෙන්නේ හොද වැඩ කරලා හොද වචන කතා කරලා හොඳ සිතිවිලි හිතලා නිර්මාණය කරගත් මල් මාලා තියන අයට එහෙම අයට අසීමිත නිරාමිස සතුටක් දැනෙනවා.ඔබ කලෙත් මේ පිංකම නමැති මලක් නෙලා ගත් එක තමයි, මේ මලේ පැහැය මේ මලේ විසිතුරු බව මේ මලේ සුවඳ ජීවිතයේ අවසාන මොහොතේත් ඔබේ මනසට ගලාගෙන ඒවි.

මගේ ධර්ම දේශනාව මම මීට වඩා දික් කරන්නට බලාපොරොත්තු වන්නේ නැහැ. මම දේශනා කළේ බුදුරජාණන් වහන්සේ

"යථාපි පුප්ඵරාසිම්හා, කයිරා මාලාගුණේ බහූ;

ඒවං ජාතේන මච්චේන, කත්තබ්බං කුසලං බහුං"

කියන මේ ගාථාව මුල්කරගෙන ජීවිත මල් මාලාව, පිළිවෙලකට ගොතා ගන්නෙ කොහොමද කියලා දේශනා කොට වදාළ බණ පදයක් මම කෙටියෙන් සාකච්ඡා කළේ. මේ පින්වතුන්ට මේ ලෝකය පිළිබඳවත් සත්වයින්ගේ ජීවිත කථා පිළිබඳවත් යම්කිසි අවබෝධයක් ලැබුනා නම්, ඔබේ මනසින් සැබෑවට දැක්කේ ජීවමාන ලොව්තුරා බුදු බුදුරජාණන් වහන්සේයි.මේ සැම දෙනාටම මේ ධර්මානිශංසයෙන් ලෝකෝත්තර නිර්වාණ සම්පත්තිය උදා වේවා කියා සාදු කියා ප්‍රාර්ථනා කරන්න.

සාදු! සාදු! සාදු!

ධර්ම පරිශ්කාරක පූජා කිරීම...

28.11.2017

බෝ මළුව පන්සල
මහා විහාරය

අනුරාධපුරය.